*සැ. යු.* -2009.10.02 දින පළ වූ අංක 1,622 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.
මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2008 වර්ෂයේ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්ගේ නාමාවලියක් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,623 - 2009 ඔක්තෝබර් මස 09 වැනි සිකුරාදා - 2009.10.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1550 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1551 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1552 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ඔක්තෝබර් මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 ඔක්තෝබර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2009 අංක 298

ඩී/22/එන්වයි/440.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2009 ජනවාරි 2 දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගන්නවා ඇත.

කොමදෝරු අගම්පොඩි චානක රූපසිංහ, ආර්එස්පී, යූඑස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0182

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

10-286

---

2009 අංක 299

ඩී/22/එන්වයි/438.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

*2008 ජූලි 1 දින සිට කපිතාන් (සිඉ) වශයෙන් :*

කොමාන්ඩර් (සිඉ) [තාවකාලික කපිතාන් (සිඉ)] මහින්ද තිලකසිරි ගලබඩ, ශ්‍රීලංනාහ-එන්ආර්සී 0602

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

10-287

---

2009 අංක 300

ඩී/22/එන්වයි/443.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2009 ජනවාරි 1 දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කපිතාන් (වි) දොන් නිහාල් ඇන්තනී ජයමහ, ශ්‍රීලංනාහ - එන්ආර්එල් 0530

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

10-285

---

2009 අංක 301

ඩී/22/එන්වයි/442.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2009 ජනවාරි 1 දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගන්නවා ඇත.

කොමාන්ඩර් (නාසෙ) ප්‍රදීප් චන්දන නිකගොල්ල, ශ්‍රීලංනාහ-එන්ආර්පී 0371

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

10-284

2009 අංක 302

ඩී/22/එන්වයි/460.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2009 ජුනි මස 05 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් කොමාන්ඩර් (නාසෙ) මුණසිංහ ආරච්චිගේ දොන් නිලන්ත සම්පත් මුණසිංහ, එන්ආර්පී 0945, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 ජුනි මස 04 වැනි දින,
කොළඹ දී ය.

10-288

2009 අංක 303

ඩී/22/එන්වයි/457.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක් සහ නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2009 ජුලි මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගැන්වීම සහ එදින සිට නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් කොමාන්ඩර් (සැ) කෝනාර මුදියන්සේලාගේ උපාලි ආරියරත්න-එන්ආර්එස් 0809, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 ජුනි මස 09 වැනි දින,
කොළඹ දී ය.

10-289

# රජයේ නිවේදන

**1985 අංක 40 දරන මිනිස්බල උපයෝගිතා සහ පරිපූරක හමුදා පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, 1985 අංක 40 දරන මිනිස්බල උපයෝගිතා සහ පරිපූරක හමුදා පනතේ 37(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත දැක්වෙන බලඇණිය, 2009 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ජාතික ශිෂ්‍යභට බලකායේ බලඇණියක් වශයෙන් නගා සිටුවා ස්ථාපිත වියයුතු බව මෙයින් නිශ්චය කරමි.

18 වන බලඇණිය - ජාතික ශිෂ්‍යභට බලකාය

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2009 සැප්තැම්බර් මස දින,
කොළඹ දී ය.

10-290

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/අම්/21.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වැනි 27 වැනි සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ), (ආ) (ඇ) (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය, මහවනාවෙල පිහිටි අම්/ශ්‍රී සුබෝධාරාම මූලික පිරිවෙන 2008.05.02 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය කිරින්දේ අරියධම්ම ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම් පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 09 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, "ඉසුරුපාය"
අධ්‍යාපන අමාත්‍යාංශයේ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

10-302

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - මඩකලපුව ශාඛාව**
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කරන ලදී)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.14 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0730-07892510-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවි 9 යටතේ ලියාපදිංචි කරන ලදී) ප්‍රසිද්ධ නොතාරිස් නිරෝජිනී වේලුපිල්ලෙයි විසින් තුනම සහතික කරන ලද 2003 මාර්තු මස 07 දිනැති අංක 264, 2003 දෙසැම්බර් මස 1 දිනැති අංක 306 සහ 2006 ජූලි මස 19 වැනි දිනැති අංක 499 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම මඩකලපුව පදිංචි කුමාරස්වාමි තංගවඩිවේල් සහ ක්‍රිෂ්ණපිල්ලෙයි තෙරේස් ලලිතා යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දහනව ලක්ෂ හතලිස් එක්දහස් විස්සයි ශත අසූඑකක (රු. 19,41,020.81) මුදලක්, 2009 ජනවාරි මස 28 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 19,41,020.81 මුදල ද, 2009 ජනවාරි මස 29 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් අට (38%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 264, 306 සහ 499 දරන බැඳුම්කරයන් මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛන සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි පත්තුවේ, මඩකලපුව මහ නගර සභා සීමාව තුළ වෝඩ් අංක 18, නාවත්කුඩා ගමේ පදුකට්ටාර් වීදි පිහිටි වරිපනම් අංක 30 සහ 28 දරන කඩච්චල් වලවු නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඒ. ඒ. කේ. තිස්ස වීරසිංහ විසින් අඳින ලද 2002.11.28 දිනැති අංක 555/2002 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ලෙස පෙන්නුම් කරනු ලබන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පෙර කී සැලැස්මේ සඳහන් ලොට් 1ඒ ද, නැගෙනහිරට : පෙර කී සැලැස්මේ සඳහන් ලොට් 3 ද, දකුණට : පදුකට්ටාර් වීදි සහ බස්නාහිරට : ප්‍රභාහාරීගේ ඉඩම ද යන මායිම් තුළ පර්චස් අටයි දශම බිංදුවයි තුනක් (අ. 0, රූ. 0, පර්. 08.03) නොහොත් හෙක්ටයාර් 0.0203ක් විශාල ගොඩනැගිලි සහ අනිකුත් වගා සහ පලදාව සහ සියලු අයිතීන් සහ එහි තුළ අඩංගු සියලු දේ සමග ඉඩම. මෙය මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය බී 586 පත්ඉරුව 251 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-385/1

---

**සෙලාන් බැංකුව පීඑල්සී - බොරලැස්ගමුව ශාඛාව**
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.14 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0340-373853-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් රාජබාලිනී රාජසුන්දරම් විසින් දෙකම සහතික කරන ලද 2004 මාර්තු මස 30 දිනැති අංක 49 සහ 2005 නොවැම්බර් මස 25 දිනැති අංක 267 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම බොරලැස්ගමුව පදිංචි පේදුරු මෙරෙන්නගේ රංජිත් සහ තෙම්මාදුර ශ්‍රියානි යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දහතුන් ලක්ෂ අනූහතරදහස් එකසිය අනූ හතරයි ශත අනූදෙකක් (රු. 13,94,194.92) මුදලක්, 2008 අගෝස්තු මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 13,94,194.92 මුදල ද, 2008 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 49 සහ 267 දරන බැඳුම්කරයන් මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, හැදිගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු බී. එස්. අලහකෝන් විසින් සාදන ලද 1998.06.15 වැනි දිනැති අංක 603 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහලන්ද සහ අඹබෝගහවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් එක්ස් 1 ලකුණු කළ (අංක 603 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් එක්ස් හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු පී. එම්. මාරකලන්ද විසින් සාදන ලද අංක 510 දරන සැලැස්මේ සඳහන් ලොට් 9හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු පී. එම්. මාරකලන්ද විසින් සාදන ලද අංක 510 දරන සැලැස්මේ සඳහන් ලොට් 8 ද. දකුණට : නොබඳින ලද කාණුව ද සහ බස්නාහිරට : ලොට් එක්ස් 2 ද යන මායිම් තුළ පර්චස් එකොලහයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 0. පර්. 11.60) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව එම් 2176/246හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

පර්චස් දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 0.40) විශාල ලොට් එක්ස්2 ලකුණු කළ (අඩි දෙකයි දශම පහක් පළල වෙන් කිරීම) (එකී අංක 603 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන එකී ලොට් එක්ස් හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව එම් 2176/247හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-385/2

---

### සෙලාන් බැංකුව පීඑල්සී - නුගේගොඩ ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.03 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0120-එල් 98317-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ටී, පී. කරුණාසේකර විසින් සියල්ලම සහතික කරන ලද 2004 දෙසැම්බර් මස 08 දිනැති අංක 969, 2007 පෙබරවාරි මස 21 දිනැති අංක 1262, 2005 සැප්තැම්බර් මස 30 දිනැති අංක 1126 සහ 2007 පෙබරවාරි මස 21 දිනැති අංක 1263 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම නුගේගොඩ ව්‍යාපාර ලියාපදිංචි අංක ඩබ්ලිව් 73094 දරන මෙසස් සුනිකෝ ට්‍රේඩිං කම්පනි යන නාමය විලාශය සහ අභිධානය යටතේ තනි ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පන්නිපිටිය පදිංචි කොඩිතුවක්කු ආරච්චිගේ සුනිල් හෙවත් සුනිල් කොඩිතුවක්කු  යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙකෝටි පනස් හය ලක්ෂ හැත්තෑදහස් තුන්සිය හැත්තෑඑකයි ශත තුනක (රු. 2,56,70,371.03) මුදලක්, 2008 නොවැම්බර් මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 2,56,70,371.03 මුදල ද, 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 969, 1262, 1126 සහ 1263 දරන බැඳුම්කරයන් මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වැනි සහ 2 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### 1 වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මාකුඹුර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සාදන ලද 1985.08.31 වැනි දිනැති අංක 2033ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහවත්ත, හෝමාගම, මායා මාවත, වරිපනම් අංක 374/4  දරන ගොඩනැගිලි, ගස්, වගා. බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 17 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 3 සහ 20 ද, නැගෙනහිරට : ලොට් 18 ද, දකුණට : ලොට් 19 සහ බස්නාහිරට : ලොට් 20 ද යන මායිම් තුළ එකී අංක 2033ඒ දරන සැලැස්ම අනුව පර්චස් දහසයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 16.5) විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව පී 1064/258හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 17 දැන් නැවත මැන ඇති අතර බයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සාදන ලද 2004.06.30 දිනැති අංක 5957 දරන සැලැස්මේ පෙන්නුම් කරන අතර පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මාකුඹුර පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සාදන ලද 2004.06.30 දිනැති අංක 5957 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහවත්ත නමැති, ගොඩනැගිලි, ගස්, වගා බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඒ ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට අංක 2033ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 3 සහ 20 ද, නැගෙනහිරට : අංක 2033ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 18 ද, දකුණට : අඩි 20ක් පළල පාර, අංක 2033ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 19 ද සහ බස්නාහිරට : අඩි 10ක් පළල පාර, අංක 2033ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 20 ද යන මායිම් තුළ එකී අංක 5957 දරන සැලැස්ම අනුව පර්චස් දහසයයි දශහ පහක් (අ. 0, රූ. 0, පර්. 16.5) විශාල ඉඩම.

පහත සඳහන් ඉඩම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතීන් සහ එයට අදාල වෙනත් පොදු අයිතීන් සමග ය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මාකුඹුර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සාදන ලද 1985.08.31 දිනැති අංක 2033ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහවත්ත නමැති, ඉඩමේ ලොට් 19 ලකුණු කළ (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට්ස් 15, 16, 17, 18, 20 සහ 21 ද, නැගෙනහිරට : ලොට් 1, 8ඒ සහ 12 ද, දකුණට : පාර සහ ලොට් 9, 10, 11 සහ 12 ද සහ බස්නාහිරට : ලොට් 13 සහ 18 ද යන මායිම් තුළ එකී අංක 2033ඒ දරන සැලැස්ම අනුව පර්චස් විසිතුනක් (අ. 0, රූ. 0. පර්. 23) විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ජී 1414/51හි ලියාපදිංචි කර ඇත.

### 2 වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම සුළු නගර සභා සීමාව තුළ බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් සාදන ලද 1981.05.25 දිනැති අංක 1735 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහලන්ද නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 49 (ගල් වල) ලකුණු කළ (බලයලත් මිනින්දෝරු කේ. එම්. සමරසිංහ විසින් සාදන ලද 1979.10.12 දිනැති අංක 2073 දරන සැලැස්මේ සඳහන් එකතු කළ ලොට් සී. ඩී. සහ කියු හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස මායිම්, උතුරට : ලොට්ස් 47 සහ 50 ද, නැගෙනහිරට : ලොට් 50 ද, දකුණට : ඩේවිඩ් පෙරේරා සහ තවත් අයගේ පුවක්ගහකුඹුර සහ බස්නාහිරට : ලොට් 48 සහ 55 ද යන මායිම් තුළ එකී අංක 1735 දරන සැලැස්ම අනුව පර්චස් විසි දෙකයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 22.25) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 2504/143හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 49 දැන් නැවත මැන ඇති අතර බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සාදන ලද 2005.06.18 දිනැති අංක 6125 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අතර පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, බොරලැස්ගමුව පිහිටි බයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සාදන ලද 2005.06.18 දිනැති අංක 6125 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහලන්ද නමැති ගොඩනැගිලි, ගස්, වගා බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඒ ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1735 දරන සැලැස්මේ සඳහන් ලොට්ස් 47 සහ 50 ද, නැගෙනහිරට : අංක 1735 දරන සැලැස්මේ සඳහන් ලොට් 50 ද, දකුණට : ඩේවිඩ් පෙරේරා සහ තවත් අයට අයිති පුවක්ගහකුඹුර සහ බස්නාහිරට : අංක 1735 දරන සැලැස්මේ ලොට් 48 සහ 55 (අඩි 10ක් පළල පාර) ද යන මායිම් තුළ එකී අංක 6125 දරන සැලැස්ම අනුව පර්චස් විසි දෙකයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 22.25) විශාල ඉඩම

පහත සඳහන් ඉඩම තුළ උඩින් හා දිගේ මාර්ග අයිතීන් සහ එයට අදාළ වෙනත් පොදු අයිතීන් සමග.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම සුළු නගර සභා සීමාව තුළ බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් සාදන ලද 1981.05.25 දිනැති අංක 1735 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහලන්ද නමැති ඉඩමේ ලොට් 55 ලකුණු කළ (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) (බලයලත් මිනින්දෝරු කේ. එම්. සමරසිංහ විසින් සාදන ලද 1979.10.12 දිනැති අංක 2073 දරන සැලැස්මේ සඳහන් එකතු කළ ලොට් සී. ඩී. සහ කියු හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 37 සහ 46 ද, නැගෙනහිරට : ලොට් 49 ද, දකුණට : ලොට් 36 සහ 48 ද, සහ බස්නාහිරට : ලොට් 52 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද යන මායිම් තුළ එකී අංක 1735 දරන සැලැස්ම අනුව පර්චස් හතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 4.5) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 2012/297හි ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම සුළු නගර සභා සීමාව තුළ බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් සාදන ලද 1981.05.25 දිනැති අංක 1735 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහලන්ද නමැති, ඉඩමේ ලොට් 52 ලකුණු කළ (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) (බලයලත් මිනින්දෝරු කේ. එම්. සමරසිංහ විසින් සාදන ලද 1979.10.12 දිනැති අංක 2073 දරන සැලැස්මේ සඳහන් එකතු කළ ලොට් සී. ඩී. සහ කියු හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 24 (අඩි 30ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, නැගෙනහිරට : ලොට් 35, 36, 55 සහ 37 ද, දකුණට : ඩේවිඩ් පෙරේරා සහ තවත් අයට අයිති පුවක්ගහකුඹුර සහ බොරලැස්ගමුව විල ද, සහ බස්නාහිරට : ලොට් 29, 30, 31, 32, 33 සහ 34 ද යන මායිම් තුළ එකී අංක 1735 දරන සැලැස්ම අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 2388/271හි ලියාපදිංචි කර ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම සුළු නගර සභා සීමාව තුළ බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් සාදන ලද 1981.05.25 දිනැති අංක 1735 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහලන්ද නමැති, ඉඩමේ ලොට් 24 ලකුණු කළ (අඩි 30ක් පළල පාර සඳහා වෙන් කිරීම) (බලයලත් මිනින්දෝරු කේ. එම්. සමරසිංහ විසින් සාදන ලද 1979.10.12 දිනැති අංක 2073 දරන සැලැස්මේ සඳහන් එකතු කළ ලොට් සී. ඩී. සහ කියු හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ඇල්හේන පාර ද, නැගෙනහිරට : ලොට් 42, 41, 53, 40, 39 සහ 54 ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 52 සහ බස්නාහිරට : ලොට් 23, 25, 26, 27, 28 සහ 29 ද යන මායිම් තුළ එකී අංක 1735 දරන සැලැස්ම අනුව පර්චස් තිස් හතරක් (අ. 0, රූ. 0, පර්. 34) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 2194/282හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

10-386/5

---

### සෙලාන් බැංකුව පීඑල්සී - නිට්ටඹුව ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2009.07.03 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන

වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0870-01197743-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. එම්. අයි. විජේවික්‍රම විසින් සහතික කරන ලද 2005 දෙසැම්බර් මස 01 දිනැති අංක 2555 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම බොරලැස්ගමුව පදිංචි නලීන් බර්ට්‍රන්ඩ් ද සිල්වා ජාතක අබේගුණරත්න යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිනවලක්ෂ පනස්එක්දහස් හයසිය අනූවයි ශත තිස් නවයක් (රු. 29,51,690.39) මුදලක්, 2008 ජූනි මස 25 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 29,51,690.39 මුදලද, 2008 ජූනි මස 26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 2555 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, ගල්කිස්ස ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හීන්දෙනිය විසින් සාදන ලද 2001.12.17 දිනැති අංක 2480 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන බන්ගියවත්ත නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ අබේරත්න මාවත, වරිපනම් අංක 20 දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් ජේ 6 සහ අංක 5989 දරන සැලැස්මේ සඳහන් 1එස්ආර් (පාර) ද, නැගෙනහිරට : අංක 5989 දරන සැලැස්මේ සඳහන් 1එස්ආර් (පාර) සහ ලොට් 2 ද, දකුණට : ලොට් 2 සහ අබේරත්න පාර වරිපනම් අංක 12/2 සහ බස්නාහිරට : වරිපනම් අංක 12/2 යන මායිම් තුළ එකී අංක 2480 දරන සැලැස්ම අනුව පර්චස් දහයක් විශාල (අ. 0, රූ. 0, පර්. 10) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රය එම් 2829/171හි ලියාපදිංචි කර ඇත.

පහත විස්තර කරන පරිදි මාර්ග ප්‍රවේශය සමග

පෙර කී බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් සාදන ලද 1994.09.01 දිනැති අංක 5989 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කහටගහවත්ත නමැති ඉඩමේ ලොට් ජේ6 (පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 5989 දරන සැලැස්මේ සඳහන් ලොට් ජේ5 (පාර සඳහා වෙන් කිරීම) ලොට් ජේ2, ජේ3, නැගෙනහිරට : ලොට් ජේ2 සහ කොළඹ කැස්බෑව පාරේ වරිපනම් අංක 71/2 දරන පරිශ්‍රය ද, දකුණට : අංක 5989 දරන සැලැස්මේ සඳහන් ලොට් 1එස්ආර් (පාර සඳහා වෙන් කිරීම) ලොට් 1එස්1 සහ බස්නාහිරට : අබේරත්න පාර වරිපනම් අංක 12/2 දරන පරිශ්‍රය සහ ලොට් ජේ4 සහ ජේ5 (පාර සඳහා වෙන් කිරීම) යන මායිම් තුළ එකී අංක 5989 දරන සැලැස්ම අනුව පර්චස් හයයි දශම එකයි බිංදුවක් විශාල (අ. 0, රූ. 0, පර්. 6.10) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රය එම් 2102/280හි ලියාපදිංචි කර ඇත.

පෙර කී බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් සාදන ලද 1994.09.01 දිනැති අංක 5989 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කහටගහවත්ත නමැති ඉඩමේ ලොට් 1එස්ආර් (පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් ජේ65 (පාර සඳහා වෙන් කිරීම) නැගෙනහිරට : කොළඹ කැස්බෑව පාරේ වරිපනම් අංක 71/2, 69, 65, 65/2 සහ බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් සාදන ලද 1989.07.22 දිනැති අංක 4656 දරන සැලැස්මේ සඳහන් ලොට් 1එෆ් සහ 1කියු ද, දකුණට : අබේරත්න පාර සහ බස්නාහිරට : අංක 5989 දරන සැලැස්මේ සඳහන් ලොට් 1එස්1 යන මායිම් තුළ එකී අංක 5989 දරන සැලැස්ම අනුව පර්චස් දහහතයි දශම හතයි පහක් විශාල (අ. 0, රූ. 0. පර්. 17.75) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රය එම් 2687/229හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-386/4

---

**සෙලාන් බැංකුව පීඑල්සී - නුගේගොඩ ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.08.27 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0120-354820-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. කේ. මාම්පිටිය විසින් සහතික කරන ලද 2001 අප්‍රේල් මස 06 දිනැති අංක 522 සහ ප්‍රසිද්ධ නොතාරිස් ටී. පී. කරුණාසේකර විසින් සහතික කරන ලද 2005.12.13 දිනැති අංක 1145 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, පිටකෝට්ටේ පදිංචි ඉලංගසිංහ කිරිබණ්ඩාගේ සුද්දහාමිගේ නිශාන්ති ඉලංගසිංහ සහ කෝරාළලාගේ රොෂාන් අනුර කුමාර බණ්ඩාර යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දොළොස්ලක්ෂ අසූහත්දහස් පන්සිය විසිහතරයි ශත හැටහතක (රු. 12,87,524.67) මුදලක්, 2008 සැප්තැම්බර් මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 12,87,524.67 මුදල ද, 2008 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක්

(ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 522 සහ 1145 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ පිටකෝට්ටේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඩී. සී. හීන්දෙනිය විසින් සාදන ලද 1988.09.11 දිනැති අංක 135 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මඩතියගහවත්ත නැමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : වරිපනම් අංක 572 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : වරිපනම් අංක 580 දරන පරිශ්‍රය සහ බැද්දේගම පාර වරිපනම් අංක 3 දරන පරිශ්‍රය ද, දකුණට : වරිපනම් අංක 566 දරන පරිශ්‍රය සහ බස්නාහිරට : කෝට්ටේ පාර ද යන මායිම් තුළ එකී අංක 135 දරන සැලැස්ම අනුව පර්චස් දහතුනයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 13.20) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

එකී ලොට් 1, පහත සඳහන් ඉඩමේ නැවත මැනීමකි.

පෙර කී පිටකෝට්ටේ පිහිටි බලයලත් මිනින්දෝරු සී. ඒ. ඕ. බේසාර් විසින් සාදන ලද 1907.07.06 දිනැති අංක 23235 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මඩිතියගහවත්ත නැමැති, ඉඩමේ ලොට් බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් ඒ ද, නැගෙනහිරට : කලින් ඒබ්‍රහම් පින්තුට අයිතිව තිබූ කහවිටගේ රොමානිස් පෙරේරා අප්පුහාමිගේ ඉඩම ද, දකුණට : මෙම ඉඩමේ කොටසක් සහ බස්නාහිරට : ප්‍රධාන පාර ද යන මායිම් තුළ එකී අංක 23235 දරන සැලැස්ම අනුව පර්චස් දහතුනයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 13.70) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගල්කිස්ස ඉඩමේ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 1221/141 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙහි අවම මිල රුපියල් 17,500,000 වශයෙන් තවදුරටත් මෙයින් සම්මත කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-386/3

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කිරිබත්ගොඩ ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0060-185022-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.08.27 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. ආර්. ද ලිවේරා විසින් දෙකම සහතික කරන ලද 1991 ඔක්තෝබර් මස 17 දිනැති අංක 339 සහ 1995 ජූනි මස 21 දිනැති අංක 3345, ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. එල්. එච්. එච්. සිල්වා විසින් සහතික කරන ලද 1998 අගෝස්තු මස 06 දිනැති අංක 1202 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කිරිබත්ගොඩ පදිංචි ගණේගොඩ විතාරමලාගේ ජයන්ත සීලරත්න යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ අසූනවදහස් හැටහතරයි ශත දොළහක (රු. 4,89,064.12) මුදලක්, 2008 ජූනි මස 25 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 4,89,064.12 මුදල ද, 2008 ජූනි මස 26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 339, 3345 සහ 1202 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, තලවතුහේන්පිට දකුණ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. එස්. පෙරේරා විසින් සාදන ලද 1960.09.25 වැනි දිනැති අංක 61 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මීගහවත්ත නැමැති එහි පිහිටි ගොඩනැගිලි සමග ඉඩමේ ලොට් සී ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : ගිරිගෝරිස් ගේ ඉඩම ද, නැගෙනහිරට : වික්‍රමසිංහගේ ඉඩම ද, දකුණට : තලවතුහේන්පිට සිට උඩුපිලට යන පී. ඩබ්ලිව්. ඩී. පාර සහ බස්නාහිරට : ගමේ කරත්ත පාර ද යන මායිම් තුළ එකී අංක 61 දරන සැලැස්ම අනුව පර්චස් තිස්නවයයි දශම හතරක් (අ. 0. රූ. 0, පර්. 39.4) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සී 509/145 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-386/2

**සෙලාන් බැංකුව පීඑල්සී - වැලිවේරිය ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0630-1359271-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.08.27 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. එම්. අයි. විජේවික්‍රම විසින් සියල්ලම සහතික කරන ලද 2005 ජුලි මස 07 දිනැති අංක 2312, 2006 ජුලි මස 28 දිනැති අංක 2942 සහ 2007 මාර්තු මස 26 දිනැති අංක 3208 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙකටන ව්‍යාපාර පදිංචි අංක එම් එන් 725 දරන "මෙසස් ලංකා ග්‍රැනයිට් මයින්ස් " යන නාමය, විලාශය සහ අභිධානය යටතේ ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන තුඩුගල අප්පුහාමිලාගේ දයානන්ද යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හතලිස්හය ලක්ෂ අනූ පන්දහස් නවසිය විසිහතරයි ශත පනස්තුනක (රු. 46,95,924.53) මුදලක්, 2008 ඔක්තෝබර් මස 23 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 46,95,924.53 මුදල ද, 2008 ඔක්තෝබර් මස 24 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 2312, 2942 සහ 3208 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ, හැලුම්මහර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. කේ. පී. රාමනායක විසින් සාදන ලද 2005.06.23 දිනැති අංක 3023 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලාවුලුගහවත්ත, දෙල්ගහවත්ත හෙවත් දවටගහවත්ත නැමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මුකලාන හන්දියේ සිට කැරගලට යන ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : ලොට් 2 ද සහ බස්නාහිරට : අංක 314 දරන සැලැස්මේ සඳහන් ලොට් බී ද යන මායිම් තුළ එකී අංක 3023 දරන සැලැස්ම අනුව රූඩ් තුනයි පර්චස් විසිනවයයි දශම එකයි හතක් (අ. 0, රූ. 3, පර්. 29.17) විශාල එහි පිහිටි සියලු දේත් සමග ඉඩම.

එකී ලොට් 1 පහත විස්තර කරනු ලබන පරිදි නැවත මනින ලද ඉඩමකි.

බස්නාහිර පළාතේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියණෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ, හැලුම්මහර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්ලිව්. එදිරිසිංහ විසින් සාදන ලද ලද 1940.06.29 දිනැති අංක 314 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලාවුලුගහවත්ත, දෙල්ගහවත්ත හෙවත් දවටගහවත්ත නැමැති ඉඩමේ ලොට් සී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : කැරගලට යන පාර ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් ඩී ද, දකුණට : ගල්වැට අගල ද සහ බස්නාහිරට : ටී. නෝනොහාමිට අයිති ලොට් බී ද, යන මායිම් තුළ එකී අංක 314 දරන සැලැස්ම අනුව අක්කර එකයි පර්චස් අටයි දශම තුනක් (අ. 1, රූ. 0, පර්. 8.3) වඩාත් නිවැරදිව රූඩ් තුනයි පර්චස් විසිනවයයි දශම එකයි හතයි පහක් (අ. 0, රූ. 3, පර්. 29.175) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 248/149හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-386/1

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2000000765.

ණයකරුගේ සම්පූර්ණ නම : කොස්වත්තේ ගෙදර අජිත් කොස්වත්ත.

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. පී. ඒ. වික්‍රමආරච්චි විසින් ලියා සහතික කරන ලද අංක 1338 හා 2007.10.11 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් නවලක්ෂ පනස් එකයි ශත හතලිස් නවයක (රු. 9,00,051.49) මුදලක් වර්ෂ 2009.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හත්ලක්ෂ අනූපන් දහස් නවසිය විසි හතරයි ශත හතරක (රු. 7,95,924.04) මුදල ද වර්ෂ 2009.01.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් එක්ලක්ෂ හාර දහස් එකසිය විසි හතයි ශත හතලිස් පහක (රු. 1,04,127.45) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් නවලක්ෂ පනස් එකයි ශත හතලිස් නවයක (රු. 9,00,051.49) ද,

(2) එකී රුපියල් හත්ලක්ෂ අනූපන් දහස් නවසිය විසි හතරයි ශත හතරක (රු. 7,95,924.04) මුදල මත අයවිය යුතු වර්ෂයකට 20.80%

බැගින් වන පොලියක් 2009.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලැල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ මාර්තු මස 03 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැන්දෙ කෝරළේ, රඹේව ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වහමල්ගොල්ලෑව ග්‍රාමයේ හි පිහිටි හික්ගහවත්ත නැමැති ඉඩමට 2003.07.18 දින ජේ. ඒ. වී. රාජනායගම් මානක තැන විසින් මැන සම්පාදිත අංක 3066 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට : F. V. P. 124 පිඹුර ප්‍රකාර ලොට් 156 2/2 හා ලොට් 155 සහ F. V. P. 123 පිඹුර ප්‍රකාර ලොට් 142 ද, නැගෙනහිරට : F. V. P. 123හි ලොට් අංක 141 ද, දකුණට : F. V. P. 124හි ලොට් 208 සහ F. V. P. 123හි ලොට් 144 (නගර සභා පාර) ද, බටහිරට : F. V. P. 124හි ලොට් 158 අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි රූඩ් තුනයි පර්චස් තිස් හතයි දශම හතයි පහක (අ. 0. රූ. 3, පර්. 37.75) වපසරියකින් යුතු මෙම ඉඩම ගොඩනැගිලි හා ඊට අයත් සියළු දේ ද මාර්ග පරවශතාවය ද සමග අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO 661/31හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

10-396

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 02/3/00/02174.

ණයකරුගේ සම්පූර්ණ නම : දිනයදුර තුසිත සිල්වා.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එන්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 1506 හා 2008.03.19 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස්හය දහස් අටසිය අසූ දෙකයි ශත තිහක (රු. 2,36,882.30) මුදලක් වර්ෂ 2009.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ දොලොස් දහස් හාරසියයක (රු. 2,12,400) මුදල ද, වර්ෂ 2009.04.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිහතර දහස් හාරසිය අසූ දෙකයි ශත තිහක් (රු. 24,482.30) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ තිස්හය දහස් අටසිය අසූ දෙකයි ශත තිහක (රු. 2,36,882.30) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ දොලොස් දහස් හාරසියයක (රු. 2,12,400) මුදල මත අයවිය යුතු වර්ෂයකට 25% බැගින් වූ අමතර පොළියක් 2009.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ මැයි මස 26 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, කටාන ග්‍රාමයෙහි වවුල්හොරේවත්ත හෙවත් තේක්කවත්ත නැමැති ඉඩමට 2007.01.13 දින එස්. බාලේන්ද්‍ර මානක තැන විසින් මැන සම්පාදිත අංක එස්.බී./2007/05 පිඹුර ප්‍රකාර කැබැලි අංක ඒට මායිම්, උතුරට සහ නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස (පිඹුරු අංක 716හි කැබලි අංක 2) ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ( පිඹුරු අංක 716හි කැබලි අංක 3) ද, සහ බටහිරට : අඩි 12ක් පළල පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක (අ. 0. රූ. 0, පර්. 10) වපසරියකින් යුතු මෙම ඉඩම ගොඩනැගිලි හා ඊට අයත් සියළු දේ ද සහ කැබලි අංක ඒ හි මාර්ග පරවශ්‍යතාවය ද සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E929/144හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

10-395

LE/RE/201.

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0500000394.

ණයකරුගේ සම්පූර්ණ නම : දසනායක මුදියන්සේලාගේ ලයනල් දසනායක.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ජේ. එම්. කුමාරසිරි විසින් ලියා සහතික කරන ලද අංක 570 හා 1999.01.18 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑ දෙදහස් නවසිය දාහතයි ශත පනස් දෙකක (රු. 72,917.52) මුදලක් වර්ෂ 2008.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැට තුන් දහස් හතලිස් අටයි ශත අනූ හතක (රු. 63,048.97) මුදල ද වර්ෂ 2008.12.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් නව දහස් අටසිය හැට අටයි ශත පනස් පහක් (රු. 9,868.55) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හැත්තෑ දෙදහස් නවසිය දාහතයි ශත පනස් දෙකක (රු. 72,917.52) ද,

(2) එකී රුපියල් හැට තුන් දහස් හතලිස් අටයි ශත අනූ හතක (රු. 63,048.97) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.5% බැගින් වන පොළියක් 2009.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර අයි. ඩබ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ ජනවාරි මස 27 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උතුරු මාතලේ වගපනහ පල්ලේසියා පත්තුවේ, නායකුඹුර සහ වත්තෙගම්මැද්ද ග්‍රාමයෙහි කුළුපනාවත්ත (දෙහිගහමුලේයාය සමග ඒකාබද්ධ කරන ලද ඉරෙවෙලයාය නවවෙල්ගොල්ලයාය, වැවේයායහේන, වැවේයාය උඩගෙදරහේන සහ වැවේයායහන්ලිගිගෙදර හේනෙහි ඉතිරි කොටස නමැති ඉඩමට 1997.02.27 දින ඩී. වීරසේකර මානක තැන විසින් මැන සම්පාදිත අංක 3683 පිඹුර ප්‍රකාර කැබලි අංක 118ට මායිම්, උතුරට : කැබලි අංක 106 සහ පාර ද, නැගෙනහිරට : කැබලි අංක 119 ද, දකුණට : රත්මලගොල්ල හේන ද, බටහිරට කැබලි අංක 116 සහ 117 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසි හතයි දශම හතරයි අටක (අ. 0, රූ. 0, පර්. 27.48) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශ්‍යතාව ද සමග මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී415/240 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

10-394

---

LE/RE/201.

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 1900001710.

ණයකරුගේ සම්පූර්ණ නම : සමරවික්‍රම කුරුප්පුගේ ධර්මදාස සහ දිසානායක ආරච්චිලාගේ හැරියට්.

පුත්තලම ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. එම්. බී. අමීන් විසින් ලියා සහතික කරන ලද අංක 4323 හා 1999.04.30 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ දහඅට දහස් පන්සිය හැත්තෑ එකයි ශත අසූ එකක (රු. 2,18,571.81) මුදලක් වර්ෂ 2009.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ පන්දහස් හැටයි ශත විසිපහක (රු. 2,05,060.25) මුදල ද වර්ෂ 2009.01.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් දහතුන් දහස් පන්සිය එකොළහයි ශත පනස් හයක (රු. 13,511.56) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ දහඅට දහස් පන්සිය හැත්තෑ එකයි ශත අසූ එකක (රු. 2,18,571.81) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ පන්දහස් හැටයි ශත විසිපහක (රු. 2,05,060.25) මුදල මත අයවිය යුතු වර්ෂයකට 19.50% බැගින් වන පොළියක් 2009.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. පී, සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ මාර්තු මස 03 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පණ්ඩිත පත්තු දෙමළ හත් පත්තුවේ, ආණමඩුව ප්‍රාදේශීය සභා සීමාවේ ආණමඩුව ග්‍රාමයේ හි පිහිටි පලුගහකැලේ දැන් පලුගහමුලහේන නැමති ඉඩමට 1987.10.15 වැනි දින ඩබ්. සී. එස්. එම්. අබේසේකර මානක තැන විසින් මැන සම්පාදිත අංක 163/87 පිඹුර ප්‍රකාර ලොට් 44 මායිම්, ඊසානට : පුත්තලම පාර ද, ගිණිකොණට : ලොට් 45 ද, නිරිතට : පිඹුරු අංක 193/86 හි ලොට් 76 ද, වයඹට : ලොට් 43 ද යන මායිම් තුළ පිහිටි පර්චස් හයක (අ. 0, රූ. 0, පර්. 6) ක වපසරියකින් යුතු මෙම ඉඩම ගොඩනැගිලි හා ඊට අයත් සියළු දේද් මාර්ග පරවශතාවය ද සමග පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එස්42/208හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

10-393

---

### මහජන බැංකුව - කඳාන ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.31 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2005.12.22 දිනැති අංක 2820 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, ජයවර්ධන වික්‍රමරත්න මහවිදානෙලාගේ සුමේන්ද්‍ර ෆැන්සිස් සීමන් සහ මාරසිංහ ආරච්චිගේ වරුණි ඉනෝෂා ලක්මාලි යන අය විසින් පැහැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් අටලක්ෂ දහනවදහස් එකසිය අනූඅටයි ශත අනූ දෙක (රු. 819,198.92) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 2008.12.20 දින සිට වර්ෂයකට 16.75% බැගින් රුපියල් අටලක්ෂ දහනවදහස් එකසිය අනූඅටයි ශත අනූ දෙක (රු. 819,198.92) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් අටලක්ෂ දහනවදහස් එකසිය අනූඅටයි ශත අනූ දෙක (රු. 819,198.92) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 2820 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණීය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභාවට අයත් කඳාන උපකාර්යාල බල සීමාවේ බටගම දකුණ ගමේ බාලසූරිය මාවතේ වරිපනම් අංක 179/4 ස්ථානයේ පිහිටි කටුඉඹුලගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ටී. පෙරේරා මහතා විසින් 2005.07.07 වැනි දින මැන සකස් කරන ලද පිඹුරු අංක 3967 හි ලොට් අංක X දරන බිම් කොටස සඳහා මායිම් උතුරට කුඹුර ද, නැගෙනහිරට මෙම ඉඩමේ ලොට් D සහ අඩි 10 පළල පාර (ලොට් B) ද, දකුණට අඩි 10 පළල පාර (ලොට් B) ද, බස්නාහිරට ලොට් A හි ඉතිරි කොටස ද යන මායිම් තුළ පිහිටි පර්චස් දාහත (අ. 0, රූ. 0, පර්. 17) (හෙක්ටයාර් 0.0430) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී597/122 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී පිඹුරේ පාරවල් සඳහා වෙන්කල කොටස්වල මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

10-317

---

### මහජන බැංකුව - දංකොටුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.05.15 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2005.01.20 දිනැති අංක 2348 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, දොන් ප්‍රෙම්ල් ලූසියන් ඉෂන්ත තන්තිරිමුදලි, අමරසිංහ ආරච්චිගේ පුෂ්පා උදයංගනී රේණුකා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එකොලොස් ලක්ෂ හැට එක් දහස් දෙසිය විසි හතයි ශත හැට හතර (රු. 11,61,227.64)

ක මුදලක් අයවීමට ඇති බැවින්, 2008.12.24 දින සිට වර්ෂයකට 15.5% බැගින් රුපියල් එකොලොස් ලක්ෂ හැට එක් දහස් දෙසිය විසි හතයි ශත හැට හතර (රු. 1161,227.64) ක මුදල සඳහා පොළිය ද, වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 (29L) වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් එකොලොස් ලක්ෂ හැට එක් දහස් දෙසිය විසි හතයි ශත හැට හතර (රු. 1161,227.64) ක මුදල අයකර ගැනීම සඳහා මීගමුව බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් එකී අංක 2348 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත්, දකුණු පිටිගල් කෝරලේ, ඕතර පළාතේ, ලුනුවිල නමැති ගමේ පිහිටි කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක පී. එච්. ඊ. මෙන්ඩිස් මහතා විසින් 1985.10.26 වැනි දින මැන සාදන ලද අංක 4041 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1 දරන කොටසට මායිම්, උතුරට එන්. රාජපක්ෂට අයිති ඉඩම ද, නැගෙනහිරට ඩබ්. ආර්. එස්. ප්‍රනාන්දු මානක තැනගේ අංක 7469 දරන පිඹුරේ සඳහන් ලොට් අංක 8 දරන පියුස් පීරිස්ට අයිති ඉඩම ද, දකුණට මහා මාර්ගයේ සිට දිවෙන පාරද, බස්නාහිරට ඩබ්. ආර්. එස්. ප්‍රනාන්දු මානක තැනගේ අංක 7469 දරන පිඹුරේ සඳහන් ලොට් අංක 5 දරන කොටස ද යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් අක්කර බිංදුවයි රූඩ් එකයි පර්චස් හය (අක්. 0, රූ. 01, පර්. 6.00) ක් විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි යනාදී සෑම සියලුදේත් සමඟ වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 51/113 හි ලියාපදිංචි වී ඇත.

එකී ලුනුවිල නමැති ගමේ පිහිටි කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. ආර්. එස්. ප්‍රනාන්දු මහතා විසින් 1953.11.04 වැනි දින මැන සාදන ලද අංක 7469 දරන පිඹු ප්‍රකාර පාරක් සඳහා වෙන්කළ බිම්තීරයට මායිම්, උතුරට ඉහත පිඹුරේ සඳහන් ලොට් අංක 2, 3, 4, 5, 6 සහ 7 දරන කොටස් ද, නැගෙනහිරට ඉහත පිඹුරේ ලොට් අංක 8 සහ 9 දරන කොටස් ද, දකුණට ඉහත පිඹුරේ ලොට් අංක 10, 11, 12, 13, 14 සහ 15 දරන කොටස් ද, බස්නාහිරට ඃ පාර ද යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් අක්කර බිංදුවයි රූඩ් බින්දුවයි පර්චස් දහසයයි දශම හතයි පහ (අක්. 0, රූඩ්. 0, පර්. 16.75) ක් විශාල අඩි 12 ක් පළල පාර පොදුවේ පාරක් වශයෙන් භාවිතා කිරීමේ මාර්ග පරවශතාවයද මේ සමඟ වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 43/69 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
පුත්තලම.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර
නාත්තන්ඩිය.

10-323

### මහජන බැංකුව - සීදූව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.08.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජිත ඒ ද සිල්වා විසින් සහතික කරන ලද 2005.06.30 දිනැති අංක 2144 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, පත්තිනි කුට්ටිගේ ඇන්ටන් විමලනාත් නෝනිස්, ජයසිංහ ආරච්චිගේ නිලූකා බර්නදෙත් සිල්වා සහ ජයසිංහ ආරච්චිගේ ටියුඩර් ජස්ටින් සිල්වා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් පන්ලක්ෂ හතලිස් හත්දහස් හයසිය විසිපහයි ශත විසි නවය (රු. 547,625.29) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 2009.02.06 දින සිට වර්ෂයකට 15.75% බැගින් රුපියල් පන්ලක්ෂ හතලිස් හත්දහස් හයසිය විසි පහයි ශත විසි නවය (රු. 547,625.29) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ වෙන්දේසි ගාස්තුද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පන්ලක්ෂ හතලිස් හත්දහස් හයසිය විසි පහයි ශත විසි නවය (රු. 547,625.29) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩලස් කෙලාට්ස් වෙන්දේසිකාර (පුද්ගලික) සමාගම විසින් එකී අංක 2144 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, බන්ඩිගොඩ ගමේ පිහිටි මාළුළියඑස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. ද සිල්වා විසින් 2000.01.30 වැනි දින මැන සාදන ලද අංක 6116 දරන පිඹුරේ ලොට් අංක 25බී දරන බිම් කොටසට මායිම් උතුරට පාර ද, නැගෙනහිරට පාර ද, දකුණට ලොට් 26 ද, බස්නාහිරට ලොට් 25 ඒ යන මායිම් තුළ පිහිටි පර්චස් දොලහ (අ. 0, රූ. 0, පර්. 12.0) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 583/27 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන්කර ඇති කොටසේ මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර, මුදුන්ගොඩ.

10-318

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ණය ගිණුම් අංක :- 249995, 285666.
නුවරගෙදර නූර් මොහොමඩ් නව්ෆීල්.
මීරා සයිබු මොහොමඩ් ජමීල්.

2009 ජූනි මස 19 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ආර්. ජයවර්ධන විසින් සහතික කරන ලද 2005.07.20 දින අංක 5021 සහ 2006.02.24 දින අංක 5251 දරන කොමර්ෂල් බැක්ස් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරය යටතේ නුවරගෙදර නූර් මොහොමඩ් නව්ෆීල් සහ මීරා සයිබු මොහොමඩ් ජමීල් බන්ධනදායින්/උකස්කරුවන් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ විසිතුන්දාස් හාරසිය හතයි ශත අනූපහක (රු. 523,407.95) මුදලක් 2009 මැයි මස 05 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පන්ලක්ෂ විසිතුන්දාස් හාරසිය හතයි ශත අනූ පහක (රු. 523,407.95) මුදල හා 2009 මැයි මස 06 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 390,685 ක මුදලක් සඳහා වාර්ෂිකව 26% බැගින් වූ පොලිය ද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩු කර අය කර ගැනීම සඳහා එකී අංක 5021, 5251 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපල හා පරිශ්‍රය මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ, අංක 83/5 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

**ඉහත කී උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර සභා සීමාව තුළ මහයියාව දැන් කටුගස්තොට පාරෙහි පිහිටි වැලිකුඹුර අම්බලන්පිටියේ වත්ත (කොටසක්) නමැති ඉඩමට බලයලත් මානක ජී. ආර්. ඩබ්. එම්. වීරකෝන් විසින් සාදන ලද 2003.07.29 වැනි දින අංක 13345 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 01 දරන ඉඩම් කොටසට ඉහත කී පිඹුරේ සඳහන් පරිදි මායිම් එනම්, උතුරට : වරිපනම් අංක 131 දරන දේපලෙන් ද, නැගෙනහිරට : මහනුවර-කටුගස්තොට ප්‍රධාන මාර්ගයෙන් ද, දකුණට : රත්නායක බේකරියට අයත් වරිපනම් අංක 121 දේපලෙන් ද සහ බස්නාහිරට : වරිපනම් අංක 127/1 දරන දේපලෙන්ද යන මෙකී මායිම් තුළ පර්චස් තුනයි දශම හතරයි දෙකක් (අ. 0, රූ. 0, ප. 3.42) විශාල ඉඩම හා එහි තුළ පිහිටි ගහකොළ වගාව ගොඩනැගිලි ඇතුළු සියළු දේ. ඉහත කී ලොට් 01 දරන ඉඩම පහත සඳහන් ඉඩම්වලින් ඒකාබද්ධ වූ කොටසක්.

01. ඉහත කී මහයියාව දැන් කටුගස්තොට පාරේ පිහිටි වැලිකුඹුර අම්බලන්පිටියේ වත්ත (කොටසක්) නමැති ඉඩමට බලයලත් මානක එල්. ඒ. ඩී. සී. විජේතුංග විසින් සාදන ලද 1969.09.26 වැනි දින අංක 6104 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන් කළ වරිපනම් අංක 127 දරන දේපළට මායිම් එනම්, උතුරට : පෙත්තකොස්ත මීසමට අයත් දේපලෙන් ද, නැගෙනහිරට: කටුගස්තොට පාරෙන් ද, දකුණට : Y, X පටු මාර්ගයෙන් ද (passage) සහ බස්නාහිරට : බේලින් සහ තවත් අයගේ උරුමක්කාරයින්ට අයත් කුඹුරෙන්ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දෙකයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, ප. 2.25) විශාල ඉඩම හා එහි තුළ පිහිටි ගහකොළ වගාව ගොඩනැගිලි ඇතුළු සියළු දේ. මෙය මහනුවර ඉඩම් කාර්යාලයේ A102/196 හි ලියාපදිංචි කර ඇත.

02. ඉහත කී මහයියාව දැන් කටුගස්තොට පාර පිහිටි වැලිකුඹුර සහ අම්බලන්පිටියේ වත්ත (කොටසක්) නමැති ඉඩමට බලයලත් මානක එල්. ඒ. ඩී. සී. විජේතුංග විසින් සාදන ලද 1969.09.26 වැනි දින අංක 6104 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන් කළ වරිපනම් අංක 128 දරන ඉඩමට මායිම් එනම්, උතුරට : Y, X පටු මාර්ගයෙන් ද, (passage) නැගෙනහිරට : Y, X පටුමාර්ගයෙන් ද (passage) දකුණට : වරිපනම් අංක 121 දරන දේපලෙන්ද, බස්නාහිරට X, Z පටු මාර්ගයෙන් ද (passage) යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් බිංදුවයි දශම නවයයි පහක් (අ. 0, රූ. 0, ප. 0.95) විශාල ඉඩම හා එහි තුළ පිහිටි ගහකොළ වගාව ගොඩනැගිලි ඇතුළු සියළු දේ. මෙය මහනුවර ඉඩම් කාර්යාලයේ A144/16 හි ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

10-274

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

කේ. එන්. විමලසේන සහ ජී. වී. අනුලාවතී.

ගිණුම් අංක : 1021 5314 6430.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ ජූනි මස 25 වෙනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පිඑල්සී නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් වන ඒ. ජේ. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 ජූනි 27 සහ දාතම හා අංක : 1374 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තලව මොරගොඩ, 7 වෙනි සැතපුම් කණුව හි පදිංචි කටුපොත නයිදෙලාගේ විමලසේන සහ ගල්පොල විදානෙලාගේ අනුලාවතී යන දෙදෙනා බන්ධනදායින් වශයෙන් හා එකී ගල්පොල විදානෙලාගේ අනුලාවතී උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හයලක්ෂ දෙදහස් හයසිය තිස්තුනයි ශත අසූතුනක (රු. 6,02,633.83) මුදලක් 2009 මැයි 28 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් හයලක්ෂ දෙදහස් හයසිය තිස්තුනයි ශත

අසූතුනක (රු.602,633.83) මුදලද 2009 මැයි 29 දින සිට අංක 1374 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන්ලක්ෂ එකොලොස් දහස් එකසිය විස්සක (රු. 5,11,120) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1374 දරන එකී බැඳුම්කරය මගින් ලබාගත්තා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, තිසාව කෝරළේ, වෙලගෙදර ග්‍රාමයේ පිහිටි "විලගෙදරවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද 1996 නොවැම්බර් දාතම හා අංක 215/96 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 185 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ප්‍රධාන පාර නැගෙනහිරට : ලොට් 184 දකුණට : ලොට් 186 සහ බස්නාහිරට : ලොට් 193 ඒ (පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහඅටක් (අ. 0, රූ. 0, පර්. 18) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්‍රිරුව ඩී 1177/178 හි කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී පිඹුරු අංක 215/96 හි නිරූපිත ලොට් 193 ඒ වශයෙන් ලකුණු කොට ඇති ඉඩම මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-398/1

---

### මහජන බැංකුව - හලාවත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.06.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් රුචිනි ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2006.10.13 දිනැති අංක 4789 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, ගාල්ලගේ ජූඩ් මහින්ද ප්‍රසාද් ප්‍රනාන්දු යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් පන් ලක්ෂ විසිඅට දහස් නවසිය හතයි ශත හතර (රු.528,907.04) ක මුදලක් අයවීමට ඇති බැවින් 2006.10.17 දින සිට වර්ෂයකට 17.5% බැගින් රුපියල් පන් ලක්ෂ විසිඅට දහස් නවසිය හතයි ශත හතර (රු.528,907.04) ක මුදල සඳහා පොලියද, වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් පන් ලක්ෂ විසි අට දහස් නවසිය හතයි ශත හතර (රු.528,907.04) ක මුදල අයකර ගැනීම සඳහා මීගමුව බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් එකී අංක 4789 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පලාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, උතුරු පිටිගල් කෝරලේ, ආනවිලුන්දන් පත්තුවේ, සුරුවිල නමැති ගමේ පිහිටි වීරකැලේ හෙවත් සිරිමල් උයන නමැති ඉඩමට එම්. ගුණසේකර, බලයලත් මානක තැන විසින් වර්ෂ 1998.04.11 දින මැන 1998.04.28 සහ 29 දිනයන්හි කොටස් කර 1998.10.24 වන දින සාදන ලද අංක 1651 ඒ දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 71 දරන කොටසට එකී මානක තැන විසින් නිකුත් කරන ලද සත්‍ය පිටපත ප්‍රකාර මායිම්, උතුරට : ඉහත කී පිඹුරේ ලොට් අංක 65 දරන කොටසද, නැගෙනහිරට : ඉහත කී පිඹුරේ ලොට් අංක 70 සහ 72 දරන පාරද, දකුණට : ඒ. එම්. අනෝරත්න හිමිකම් කියන ඉඩමද, බස්නාහිරට : පෙරේරා හිමිකම් කියන හුන්ගම්පොල කැලේ යනුවෙන් හඳුන්වන ඉඩමද යන මායිම් තුල වූ ප්‍රමාණයෙන් අක්කර බිංදුවයි රූඩ් බිංදුවයි පර්චස් විස්ස (අක්. 0, රූඩ් 0, පර්. 20) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ පලතුරු ගොඩනැගිලි ආදී සෑම සියලුදේත් මේ සමග වේ.

මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 140/05 හි ලියාපදිංචි වී ඇත.

එකී සුරුවිල නමැති ගමේ පිහිටි වී හේන කැලේ හෙවත් සිරිමල් උයන නමැති ඉඩමට එම්. ගුණසේකර බලයලත් මානක තැන විසින් 1998.04.11 වන දින මැන 1998.04.28 සහ 29 දිනයන්හි කොටස් කර 1998.10.24 වන දින සාදන ලද අංක 1651 ඒ දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 72 දරන කොටසට මායිම් උතුරට : එකී පිඹුරේ ලොට් අංක 34, 35 සහ 36 දරන කොටස් ද, ප්‍රාදේශීය සභා පාර ද, බෙදූ ලොට් 07, 09, 16, 17, 24, 25, 32, 33, 41, 42, 03, 11, 14, 19, 22, 27, 30, 35, 40, 43, 51, 53, 60, 61, 68, 38, 45, 49, 55, 58, 63, 66 සහ 70 දරන කොටස් ද, දකුණට : බෙදූ ලොට් අංක 52, 40, 69, 39, 38, සහ 70 දරන කොටස් ද, බස්නාහිරට : බෙදූ ලොට් 06, 10, 15, 18, 23, 26, 31, 34, 40, 43, 39, 44, 50, 54, 59, 62, 67, 69, 02, 12, 13, 20, 21, 28, 29, 36, 37, 46, 47, 48, 56, 57, 64, 65 සහ 71 දරන කොටස්ද යන මෙකී මායිම් තුල වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් බිංදුවයි, පර්චස් දාසයයි දශම පහ (අක්. 01, රූඩ් 0, පර්. 16.5) ක් විශාල අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන්කළ බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් භාවිතා කිරීමේ මාර්ග පරවශතාවය ද මේ සමග වේ.

මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 146/167 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර - පුත්තලම.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79- මාරවිල පාර,
නාත්තන්ඩිය.

10-324

## මහජන බැංකුව - ඇඹිලිපිටිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.07.31 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ප්‍රසිද්ධ නොතාරිස් ජනත් ජයවර්ධන මහතා විසින් සහතික කරන ලද 2005.03.07 දිනැති අංක 1263 සහ 2005.03.07 දිනැති අංක 1262 හා 2006.05.05 දිනැති අංක 2227 දරන උකස්කරයන් ප්‍රකාර ගෙවීම් කිරීම රුවන් පතිරගේ දොන් පියදාස යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරයන් යටතේ පිළිවෙලින් රුපියල් තුන්ලක්ෂ හතලිස් නමදහස් නමසිය අසූවයි (රු. 349,980.00) දෙලක්ෂ හැත්තෑ හත්දහස් තුන්සිය අනූ හයයි ශත තිස් එකයි (රු. 277,396.31) හා රුපියල් ලක්ෂ දහයක (රු. 10,00,000.00) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, පිළිවෙලින් 2008.10.10 දින සිට වර්ෂයකට 17.25% 2008.12.01 දින සිට වර්ෂයකට 17.25% හා 2008.10.01 දින සිට 21.5% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ හතලිස් නමදහස් නමසිය අසූවයි (රු.349,980.00), දෙලක්ෂ හැත්තෑ හත්දහස් තුන්සිය අනූ හයයි ශත තිස් එකයි (රු.277,396.31) හා රුපියල් ලක්ෂ දහයක (රු.1,000,000.00) මුදලක් අයකර ගැනිම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ මහතා විසින් එකී අංක. 2713 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ ඇති දේපළ පිළිබඳ විස්තර

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ - කොළොන්න කෝරළේ, දියපොටගම් පත්තුවේ- ඇඹිලිපිටිය පල්ලේගම පිහිටි කොළොන්න වත්ත නොහොත් කොළොන්ගහවත්ත, පත්තිරුවල සඳහන් පරිදි කොළොන්වත්ත නොහොත් කොළොන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. පී. ධර්මරත්න මහතා විසින් මැන සාදන ලද අංක 326 සහ 1987.06.14 දිනැති පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : පල්ලේගම සිට මොරකැටිය දක්වා වූ මාර්ගයද, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසද, දකුණට මෙම ඉඩමේ ඉතිරි කොටසද, බස්නාහිරට : ශාන්ති මහතාට අයිති ඉඩමද යන මායිම් තුල පිහිටි පර්චස් දාහතරයි දශම හතරයි තුනක් (අක්. 0. රූඩ්. 0, පර්. 14.43) ක් විශාල ඉඩම සහ ඒ තුල පිහිටි සියළුම දේද වේ.

මෙම ඉඩම රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 107/214 හා ජී 107/217 යන පත්තිරුවල ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී - සබරගමුව

මහජන බැංකුව
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නව නගරය - රත්නපුරය.

10-320

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 375554.
සොෆ්ට්ටෙක් සොලියුෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

2009 මැයි මස 29 වන දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී :

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. බී. සිරිවර්ධන විසින් සහතික කරන ලද 2007 ජූලි මස 05 වන දින අංක 468 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.) නමින් වූ බැඳුම්කරය යටතේ මහනුවර හීරැස්සගල පාරේ අංක 21 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන සොෆ්ට්ටෙක් සොලියුෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් හා සෙන්දුරාජා සතීස් කුමාර් උකස්කරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිලක්ෂ හතලිස් හයදාස් නවසිය හතලිස් නවයයි ශත හතලිස් තුනක (රු. 2,046,949.43) මුදලක් 2009 මර්තු මස 06 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් විසිලක්ෂ හතලිස් හයදාස් නවසිය හතලිස් නවයයි ශත හතලිස් තුනක (රු.2,046,949.43) ක මුදල හා 2009 මාර්තු මස 07 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,698,500 ක මුදලක් සඳහා වාර්ෂිකව 22% බැගින් වූ පොලිය ද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අය කර ගැනීම සඳහා එකී අංක 468 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපල හා පරිශ්‍රය මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ, අංක 83/5 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව කුළුගම්මනසිය පත්තුව හිරියාලගම්මන ගමේ පිහිටි කලුවාවදෙනිය වත්ත සහ කුඹුර, කලුවාදෙනියේ හේන, ගොරක්ගහමුල වත්ත, ගානිමහේන, ඉලුක්ගොඩ හේන, මියනපැලදෙනිය හේන නොහොත් ඊරියගමහේන නමැති ඉඩමට බලයලත් මානක කේ. වීරපන විසින් සාදන ලද 1992.05.09 වන දින අංක 531 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 3 නැමති ඉඩම් කොටසට මායිම් එනම්, උතුරු-නැගෙනහිරට : ලොට් 1 සහ ලොට් 2 හා පාර ද දකුණු-නැගෙනහිරට : පිඹුරු අංක 4554 හි සඳහන් ලොට් 3 න් ද දකුණු - බටහිරට : ඇටඹගහමුල හේනද සහ උතුරු-බටහිරට : සෙනෙවිරත්න යන අයට අයත් රන්කොත්ගෙදර වත්ත ද යන මෙකී මායිම් තුළ පර්චස් විසි අටයි දශම අටයි හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 28.875) විශාල ඉඩම හා එහි තුළ පිහිටි ගහ කොළ වගාව සහ ගොඩනැගිලි ඇතුළු සියළු දේ. මෙය මහනුවර ඉඩම් කාර්යාලයේ H600/202 වෙළුම/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුරේ සඳහන් ලොට් 2 වඩාත් නිවැරදිව ලොට් 4 දරන මාර්ගය තුළ හා ඔස්සේ පාවිච්චි කිරීමේ සහ අනෙකුත් සියළු අයිතිවාසිකම් සමග.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

10-276

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

එච්. එච්. පී. හේරත්, ගිණුම් අංක : 0023 5001 8134

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ ජූලි මස 28 වෙනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමකදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සීමාසහිත සම්පත් බැංකුව නමින් කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. එස්. පී. පෙරේරා යන අය විසින් ලියා සහතික කරන ලද 2001 ජූලි 24 දාතම හා අංක 5442 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කුලියාපිටිය, පරාක්‍රම පාර, අංක 65 හි පදිංචි හේරත් හිටිහාමිල්ලාගේ ප්‍රේමසිරි හේරත් නොහොත් හේරත් හිටිහාමිලාගේ ප්‍රේමසිරි හේරත් බනධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තුන් ලක්ෂ පන් දහස් පන්සිය අසූ අටයි ශත දහසයක (රු.3,05,588.16) මුදලක් 2004 මැයි 31 වෙනි දිනට එකී සීමාසහිත සම්පත් බැංකුව වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් තුන් ලක්ෂ පන් දහස් පන්සිය අසූ අටයි ශත දහසයක (රු.3,05,588.16) මුදලද 2004 ජූනි 01 දින සිට අංක 5442 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙලක්ෂ විසි දහස් නමසිය අසූ හතරයි ශත හතක (රු.2,20,984.07) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි තුනක් (23%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වේතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 5442 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සීමාසහිත සම්පත් බැංකුව වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දකුණු කටුගම්පල හත් පත්තුවේ කටුගම්පල කෝරලේ එගොඩමුල්ල පිහිටි ගොරකගහ ගොඩ මඩ ඉඩම යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ඒ. එන්. ගුණසිරි යන අය විසින් සාදන ලද 1998 අගෝස්තු 10 දාතම හා අංක. 1434 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : කේ. ඩී. එෆ්. ජයසේකර ගේ ඉඩම නැගෙනහිරට : කුලියාපිටිය නාත්තන්ඩිය ප්‍රධාන පාරේ සිට පළුගමුව දක්වා ප්‍රාදේශීය සභාව පාර සහ එකී පිඹුරු අංක 1434 හි ලොට් 2 ඒ දකුණට : එකී පිඹුරු අංක 1434 හි ලොට් 2 ඒ සහ බස්නාහිරට : එකී පිඹුරු අංක 1434 හි ලොට් 1 බී වෙන්කරන දොල පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් විස්සයි දශම නමයක් (අ. 2, රූ. 3, පර්. 20.9) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව කේ 159/273 හි කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-398/2

---

**මහජන බැංකුව - පූගොඩ ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.06.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජිත ඒ. ද සිල්වා විසින් සහතික කරන ලද 2006.10.31 දිනැති අංක 3769 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, හපන්ගම ආරච්චිගේ තුසිත හේමකුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දොලොස් ලක්ෂ හතලිස් හයදහස් පන්සිය අසූ තුනයි ශත තිස් නවය (රු.12,46,583.39) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 2009.02.02 දින සිට වර්ෂයකට 17.5% බැගින් රුපියල් දොලොස් ලක්ෂ හතලිස් හයදහස් පන්සිය අසූතුනයි ශත තිස් නවය (රු. 12,46,583.39) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දොලොස්ලක්ෂ හතලිස් හයදහස් පන්සිය අසූ තුනයි ශත තිස් නවය (රු. 12,46,583.39) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩලස් කෙලාට්ස් (පුද්ගලික) සමාගම විසින් එකී අංක 3769 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපල පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ, දොම්පෙ ප්‍රාදේශීය සභා බල සීමාවේ, (පූගොඩ උප කාර්යාලය)

ගම්පල ගෙදර ගමේ පිහිටි ලිඳමුලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. කේ. පී. රාමනායක මහතා විසින් 2003.08.15 වන දින මැන සකස් කරන ලද පිඹුරු අංක 2613 දරන පිඹුරට අනුව ලොට් අංක A1 (වඩාත් නිවැරදිව 1A) දරන කොටස සඳහා මායිම් : උතුරට : පී. කේ. පීතරසිංඤෝගේ උරුමකරුවන්ට අයත් ඉඩම ද, නැගෙනහිරට : එම්. ඩී. පී. පීටරසිංඤෝ ගේ උරුමකරුවන්ට අයත් ඉඩම සහ එම්. ඩී. පී. රොබෝසිංඤෝට අයත් ඉඩමද, දකුණට : නිවෙස්වලට යන පාරද, බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුල පිහිටි පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම් ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක D363/109 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී පිඹුරේ පාරවල් සඳහා වෙන්කල කොටස් වල මාර්ග අයිතිය ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය කාර්යාලය,
131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

10-325

---

## සෙලාන් බැංකුව පීඑල්සී - ඩෙවලප්මන්ට් බැන්කිං ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.08.27 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0860-011387-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ජෙනිෆර් ආර් ප්‍රොක්ටර් විසින් තුනම සහතික කරන ලද 2008 නොවැම්බර් මස 06 දිනැති අංක 356 සහ 357 සහ 2008 දෙසැම්බර් මස 16 දිනැති අංක 372 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 2, අංක පීබී 123 දරන 1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධානයන් යටතේ ලියාපදිංචි කර සහ ස්ථාපනය කරන ලද සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් රියැලිටි ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හාරකෝටි හතලිස් එක්ලක්ෂ පනස් එක් දහස් හත්සිය දහ අටයි ශත හැත්තෑහයක (රු. 4,41,51,718.76) මුදලක්, 2009 මැයි මස 06 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 4,41,51,718.76 මුදලද, 2009 මැයි මස 07 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් අට (38%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 356, 357 සහ 372 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් පළමුවැනි සහ දෙවැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවැනි උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බටහිර පස්දුන් කෝරළේ, ඉද්දගොඩ පත්තුවේ, මතුගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බොන්දුපිටිය ගමේ පිහිටි මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2008.07.21 දිනැති අංක 3171 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අලවතුගෙඩ එස්ටේට් නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉදිගහකොට්ටුන්න, අලවතුගොඩ එස්ටේට් (අංක 217 දරන සැලැස්මේ ලොට් 3) සහ ලොට් 2 ද, නැගෙනහිරට : ලොට් 2 පාර (ප්‍රාදේශීය සභා) සහ තෙයියේහේන (ටීපී 74012) සහ දකුණට : තෙයියහේන සහ පුවක්වත්තේකොට්ටුන්න (ටීපී 74012) සහ බස්නාහිරට : අලවතුගොඩ (ටීපී 74015) යන මායිම් තුළ එකී අංක 3171 දරන සැලැස්මේ අනුව අක්කර දොළහයි රූඩ් දෙකයි පර්චස් දහහතරයි දශම හයයි බිංදුවක් (අ. 12, රූ. 2, පර්. 14.60) විශාල, එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

2. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බටහිර පස්දුන් කෝරළේ, ඉද්දගොඩ පත්තුවේ, මතුගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බොන්දුපිටිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2008.07.21 දිනැති අංක 3171 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අලවතුගොඩ එස්ටේට් නමැති ඉඩමේ ලොට් 3 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අලවතුගොඩ එස්ටේට් (අංක 217 දරන සැලැස්මේ ලොට් 3) ද, නැගෙනහිරට : පාර (ප්‍රාදේශීය සභා) ද, දකුණට : පාර (ප්‍රාදේශීය සභා) සහ ලොට් 2 සහ බස්නාහිරට : ලොට් 2 සහ අලවතුගොඩ එස්ටේට් (අංක 217 දරන සැලැස්මේ ලොට් 3) යන මායිම් තුළ එකී අංක 3171 දරන සැලැස්ම අනුව පර්චස් දොලහයි දශම නවයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 12.90) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

එකී අංක 3171 දරන සැලැමේ ලොට් 2 උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ වෙනත් අයිතීන් සමග.

### දෙවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව නගර සභා සීමාව තුළ මොරැන්ද පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2008 මාර්තු මස 28 දිනැති අංක 3108 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දම්මිනිගහවත්ත බෙදු කොටස හෙවත් දම්මිනිගහවත්ත නමැති ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියළු දේ සමග ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : දම්මිනිගහවත්ත මෙම ඉඩමේ කොටස (එච්. ඒ. ගුණරත්න සහ වෙනත් අයගේ ඉඩම්) ද, නැගෙනහිරට : ලොට් 3 ද, දකුණට : ඩී. කරුණාරත්නගේ ඉඩම සහ පුද්ගලික පාර සහ බස්නාහිරට : ලොට් 2 ද යන මායිම් තුළ එකී අංක 3108 දරන සැලැස්ම අනුව අක්කර

එකයි පර්චස් එකොලහයි දශම හතරයි හයක් (අ. 1, රූ. 0, පර්. 11.46) නොහොත් හෙක්ටයාර් 0.43365ක් විශාල ඉඩම.

පහත සඳහන් ඉඩම් උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග වෙනත් අයිතීන් සමග

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව නගර සභා සීමාව තුළ මොරන්ද පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2008 මාර්තු මස 28 වැනි දිනැති අංක 3108 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දම්මිනිගහවත්ත බෙදූ කොටස හෙවත් දම්මිනිගහවත්ත නමැති ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 2 (මහා මාර්ගය සඳහා වෙන් කිරීම්) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : දම්මිනිගහවත්ත මෙම ඉඩමේ කොටස (එච්. ඒ. ගුණරත්න සහ වෙනත් අයගේ ඉඩම්) ද, නැගෙනහිරට : ලොට් 1 ද, දකුණට : පුද්ගලික පාර සහ බස්නාහිරට : මාකන්දම සිට අම්බලන්ගොඩට යන මහා මාර්ගය ද යන මායිම් තුළ එකී අංක 3108 දරන සැලැස්ම අනුව පර්චස් දශම නවයයි (අ. 0, රූ. 0, පර්. 0.96) නොහොත් හෙක්ටයාර් 0.00243 ක් විශාල ඉඩම.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව නගර සභා සීමාව තුළ මොරන්ද පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2008 මාර්තු මස 28 වැනි දිනැති අංක 3108 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දම්මිනිගහවත්ත බෙදූ කොටස හෙවත් දම්මිනිගහවත්ත නමැති ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 3 (පස් කාණුව මීටර් 1.0) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : දම්මිනිගහවත්ත මෙම ඉඩමේ කොටස (එච්. ඒ. ගුණරත්න සහ වෙනත් අයගේ ඉඩම්) ද, නැගෙනහිරට : පස් කාණුව ද, දකුණට : ඩී. කරුණාරත්නගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් 1 ද යන මායිම් තුළ එකී අංක 3108 දරන සැලැස්ම අනුව පර්චස් දෙකයි දශම බිංදුවයි හතරක් (අ. 0, රූ. 0, පර්. 2.04) නොහොත් හෙක්ටයාර් 0.00516ක් විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී-නීති.

10-384

---

## මහජන බැංකුව - යක්කල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.06.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2005.06.30 දිනැති අංක 10214 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, හේවාකෝන් ඉන්ද්‍රානි පෙරේරා සහ මාපලගමගේ නන්දාවතී යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හයලක්ෂ නවදහස් හයසිය තිස් අටයි ශත හැට අටක (රු. 609,638.68) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2009.01.01 දින සිට වර්ෂයකට 15.75% බැගින් රුපියල් හයලක්ෂ නවදහස් හයසිය තිස් අටයි ශත හැට අට (රු. 609,638.68) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හයලක්ෂ නවදහස් හයසිය තිස් අටයි හත හැට අටක (රු. 609,638.68) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 10214 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, කඹුරාගල්ල ගමේ පිහිටි කඹුරාගල්ලවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. වී. රාජනායගම් මහතා විසින් 2005.04.25 දින මැන සකස් කරන ලද පිඹුරු අංක 5522ඒ දරන පිඹුරට අනුව ලොට් අංක 1 දරන බිම් කොටසට මායිම් : උතුරට : ඇල ද, නැගෙනහිරට : බලයලත් මානක වී. එෆ්. ජේ. පෙරේරා මහතා සකස් කල පිඹුරු අංක 4926 හි ලොට් 17 ද, දකුණට : පිඹුරු අංක 4926 හි ලොට් 21 සහ කරත්ත පාර ද, බස්නාහිරට : පිඹුරු අංක 4926 හි ලොට් 19 සහ කරත්ත පාර යන මායිම් තුල පිහිටි, රූඩ් තුන (අක්කර 0, රූඩ් 3, පර්චස් 0) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

එකී පිඹුරේ පාරවල් සඳහා වෙන්කල කොටස්වල මාර්ග අයිතිය ද සමගවේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එෆ්57/82 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය,
131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

10-322

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.